# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1,504/11 – 2007 ජුලි 04 වැනි බදාදා – 2007.07.04

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

සී.එෆ්. 1/64.

**(40 වැනි අධිකාරය වූ ) මහජන ආරක්පක ආඥාපනත**

(40 වැනි අධිකාරය වූ ) මහජන ආරක්ෂක ආඥාපනතේ 5 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලද නියෝග.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2007 ජුලි මස 04 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 2007 අංක 4 දරන හදිසි අවස්ථා (කටුනායක ගුවන් තොටුපළ අධි ආරක්ෂිත කළාපය ) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මේ නියෝගවල උපලේඛනයේ සීමා විස්තර කොට ඇති සහ මෙයට අමුණා ඇති සිතියමේ පෙන්නුම් කොට ඇති ප්‍රදේශයෙන් සංයුක්ත වන කටුනායක ගුවන් තොටුපළ සහ තදාසන්න ප්‍රදේශ මේ නියෝගවල කාර්ය සඳහා අධි ආරක්ෂිත කළාපයක් ලෙස මෙයින් පත් කරනු ලබන අතර "කටුනායක ගුවන් තොටුපළ අධි ආරක්ෂිත කළාපය " ලෙස හඳුන්වනු ලැබේ.

3. ජනාධිපතිවරයා විසින් මේ නියෝගවල කාර්ය සඳහා නිසි බලධරයකු ලෙස යම් තැනැත්තකු හෝ තැනැත්තන් නමින් හෝ ධුරයෙන් පත් කරනු ලැබිය හැකි අතර එම නිසි බලධරයා මෙම නියෝග ක්‍රියාත්මක කිරීම සඳහා වගකිව යුතු වන්නේ ය.

4. යම් විශේෂ අවස්ථාවක දී රටේ ආරක්ෂක තත්ත්වය සැළකිල්ලට ගැනීමේ දී කටුනායක ගුවන් තොටුපළ අධි ආරක්ෂිත කළාපය තුළ ඇතැම් කටයුතු පාලනය කිරීම සඳහා විශේෂ වැඩ පිළිවෙළ අවශ්‍ය බව නිසි බලධරයාගේ මතය වන අවස්ථාවක එසේ පාලනය කිරීම සඳහා අවශ්‍ය වැඩ පිළිවෙළ ඔහු විසින් සකස් කරනු ලැබිය හැකි ය.

5. (1) මෙම නියෝග යථා පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විධිවිධාන නිසි බලධරයා විසින් කලින් කල නිකුත් කරනු ලැබිය හැකිය .

(2) එවැනි විධානයකට අනුකූලව ක්‍රියා කිරීම (1) වන ඡේදය යටතේ විධානයක් නිකුත් කරනු ලැබූ යම් තැනැත්තකුගේ කාර්යය වන්නේ ය.

6. පොලිස්පතිවරයාගේ පූර්ව ලිඛිත අවසරය ලබාගෙන ඇත්නම් මිස, කිසිම තැනැත්තෙකු විසින්, කටුනායක අධි ආරක්ෂිත කළාපය තුළ –

(අ) මහජන රැළි සහ මෝටර් රථ පෙරහැර ඇතුළු කුමන ආකාරයේ හෝ පෙළපාලියක් ; හෝ

(ආ) දේශපාලනමය හෝ අන්‍යාකාරයේ වූ ප්‍රසිද්ධ රැස්වීමක් මෙහෙයවීම හෝ පැවැත්වීම,

නොකළ යුතු ය.

7. (1) පොලිස්පතිවරයා විසින් හෝ නියෝජ්‍ය පොලිස්පතිවරයාට නොඅඩු නිලයක් දරන නිලධරයකු විසින් හෝ තත් කාර්ය සඳහා නිකුත් කරන ලද අවසර පත්‍රයක බලය යටතේ මිස, කටුනායක ගුවන් තොටුපළ අධි ආරක්ෂිත කළාපයට යම් ලොරියක් හෝ ට්‍රේලරයක් පදවාගෙන යාම කිසිම තැනැත්තෙකු විසින් නොකළ යුතු ය. එවැනි සෑම අවසර පත්‍රයක් ම, එහි සඳහන් නියම හා කොන්දේසිවලට යටත් විය යුතු අතර එම ලොරිය හෝ ට්‍රේලරය හෝ පදවනු ලැබිය හැකි ගමන් මාර්ග එම අවසර පත්‍රයේ නිශ්චිතව දැක්විය යුතු ය.

(2) (1) වන ඡේදය යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රය සියලු අවස්ථාවන්හි දී අදාළවන තැනැත්තා විසින් රැගෙන යාම හෝ අදාළ ලොරියේ හෝ ට්‍රේලරයේ තබා ගැනීම කළ යුතු අතර, එම අවසර පත්‍රය කවර හෝ අවස්ථාවක දී යම් පොලිස් නිලධරයකු විසින් ඉල්ලා සිටිනු ලැබූ විට පරීක්ෂා කිරීම සඳහා එම වාහනය පදවන තැනැත්තා විසින් ඉදිරිපත් කළ යුතු ය.

(3) (1) වන ඡේදය යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක බලය යටතේ හැර සහ කටුනායක ගුවන් තොටුපළ අධි ආරක්ෂිත කළාපය තුළ සේවා පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන තාක් දුරට භාණ්ඩ පැටවීමේ හෝ ගොඩබෑමේ කාර්ය සඳහා හැර කිසිම තැනැත්තකු විසින් එම අධි ආරක්ෂිත කළාපය තුළ යම් ලොරියක් හෝ ට්‍රේලරයක් නවතා තැබීම හෝ නොකළ යුතු ය.

(4) කටුනායක ගුවන් තොටුපළ අධි ආරක්ෂිත කළාපයට ඇතුළුවන හෝ ඒ තුළට ලොරියක් හෝ ට්‍රේලරයක් පදවාගෙන යන හෝ එය තුළ ලොරියක් හෝ ට්‍රේලරයක් රඳවා තබන හෝ නවතා තබන හෝ මේ නියෝගවල විධිවිධාන උල්ලංඝනය කරමින් එම කළාපය තුළ රැඳී සිටින යම් තැනැත්තෙක් වරදකට වරදකරු වන අතර ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කිරීමේ දී –

(i) පළමු වරද සම්බන්ධයෙන් වන විට රුපියල් පන්දහසකට නොවැඩි දඩයකට ද ;

(ii) වරද දෙවනවරට කරනු ලබන අවස්ථාවක දී රුපියල් දස දහසකට නොවැඩි දඩයකට ද ;

(iii) වරද තුන්වන වරට කරනු ලබන අවස්ථාවක දී මෙම ඡේදය උල්ලංඝනය කරමින් භාවිත කරනු ලබන ලොරිය හෝ ට්‍රේලරය අධිකරණයේ ආඥාවකින් රාජ සන්තක කරනු ලැබීමට ද,

යටත් වන්නේ ය.

8. 7 වන නියෝගය යටතේ රාජසන්තක කරන ලද යම් ලොරියක් හෝ ට්‍රේලරයක් –

(අ) අදාළ වරදකරු කිරීමට එරෙහිව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද මහාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කර නැත්නම්, එම වරදකරු කිරීමට එරෙහිව එවැනි අභියාචනයක් ඉදිරිපත් කිරීමට ලබා දී ඇති කාලසීමාව අවසාන වන දිනයේ දී එම ලොරිය හෝ ට්‍රේලරය සම්පූර්ණයෙන් රජය වෙත සතුවිය යුතු ය.

(ආ) අදාළ වරදකරු කිරීමට එරෙහිව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද මහාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇත්නම් එම වරදකරු කිරීම අභියාචනාධිකරණය විසින් අවසාන වශයෙන් ස්ථිර කරනු ලබන දිනයේ දී එම ලොරිය හෝ ට්‍රේලරය සම්පූර්ණයෙන් රජය වෙත සතුවිය යුතු ය.

9. සහතිකයේ නිශ්චිතව දක්වා ඇති ක්‍රියා කටුනායක ගුවන් තොටුපල අධි ආරක්ෂිත කළාපය තුළ සිදු වූ බවට නිසි බලධරයාගේ අත්සන යටතේ නිකුත් කරන ලද සහතිකයක්, සාක්ෂි වශයෙන් ආවේශ්‍ය කළ යුතු අතර එය එහි සඳහන් කරුණු සම්බන්ධයෙන් බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.

10. මේ නියෝගවල විධිවිධාන පොලිස්පතිවරයා විසින් ක්‍රියාත්මක කිරීම නීත්‍යානුකුලවන අතර, අවශ්‍ය අවස්ථාවල දී එකී කාර්යය සඳහා කටුනායක ගුවන් තොටුපළ අධි ආරක්ෂිත කළාපය තුළ යාන්ත්‍රිකව හෝ අන්‍යාකාරයකින් ධාවනය වන මෝටර් වාහන හෝ වෙනත් යම් ප්‍රවාහන මාධ්‍යයක් භාවිත කිරීම සහ ඒවා එහා මෙහා ගෙන යාම හා නවතා තැබීම විධිමත් කරනු ලැබීම නීත්‍යානුකූල වන්නේ ය.

11. (1) යම් තැනැත්තෙකු මේ නියෝග යටතේ කටුනායක ගුවන් තොටුපළ අධි ආරක්ෂිත කළාපය තුළ වරදක් සිදු කිරීමට ඉඩ ඇති බවට හෝ මේ නියෝගවල විධිවිධාන උල්ලංඝනය කරමින් ක්‍රියා කරන බවට සැක සිතීමට යම් පොලිස් නිලධරයකුට හේතු ඇති අවස්ථාවක එම පොලිස් නිලධරයා විසින් එම තැනැත්තා පරීක්ෂා කරනු ලැබිය හැකිය.

(2) යම් තැනැත්තකු මේ නියෝග ප්‍රකාරව හෝ මේ නියෝග උල්ලංඝනය කරමින්, කටුනායක ගුවන් තොටුපළ අධි ආරක්ෂිත කළාපය තුළ වරදක් සිදු කර ඇති බව විශ්වාස කිරීමට පොලිස් නිලධරයකුට හේතු ඇති අවස්ථාවක, එම නිලධරයා විසින් වහාම ඔහුව අත්අඩංගුවට ගනු ලැබිය යුතුය. මේ නියෝග යටතේ වරදක්, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථානුකූලව සහ එම පනතේ කාර්ය සඳහා සංඥෙය වරදක් ලෙස සලකනු ලැබිය යුතුය.

12. (1) කටුනායක ගුවන් තොටුපළ අධි ආරක්ෂිත කළාපය තුළ පිහිටි යම් ගොඩනැගිල්ලක ප්‍රධාන පදිංචිකරුවා විසින් එම පරිශ්‍රයට කිසිදු අනවසර පුද්ගලයකු ඇතුළු නොවන බවට වගබලා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගත යුතු ය. එම පරිශ්‍රයේ ස්ථිර වශයෙන් පදිංචිව සිටින සියලු තැනැත්තන්ගේ ලැයිස්තුවක් ප්‍රධාන පදිංචිකරු විසින් අදාළ පොලිස් ස්ථානයේ ස්ථානභාර නිලධරයා වෙත ඔහු විසින් නියම කරනු ලැබුවහොත් ඉදිරිපත් කළ යුතුය.

(2) (1) වන ඡේදය ප්‍රකාරව නියම කරනු ලැබූ පරිදි ලැයිස්තුවක් ඉදිරිපත් කරනු ලැබ ඇති විට, ප්‍රධාන පදිංචිකරුවා විසින් එතැන් පටන් එම ලැයිස්තුවේ පදිංචිකරුවන් පිළිබඳ පසුව ඇතිවන යම් වෙනස් වීමක් පිළිබඳව, එම වෙනස සිදු වී පැය විසි හතරක් ඇතුළත, එම පොලිස් ස්ථානය භාර නිලධරයා වෙත දැනුම් දිය යුතුය.

13. කටුනායක ගුවන් තොටුපළ අධි ආරක්ෂිත කළාපය තුළ පිහිටි සෑම රජයේ දෙපාර්තමේන්තුවකම හෝ පෞද්ගලික ආයතනයක ම සේවා යෝජකයා විසින් අදාළ පොලිස් ස්ථානයේ ස්ථාන භාර නිලධරයා විසින් නියම කළ වහාම එම ආයතනයේ සේවය කරන සියලුම තැනැත්තන් පිළිබඳ විස්තර අදාළ පොලිස් ස්ථානයේ ස්ථාන භාර නිලධරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

14 . නිසි බලධරයාගේ පූර්ව ලිඛිත අවසරය නොලබා කිසිම තැනැත්තකු කටුනායක ගුවන් තොටුපළ අධි ආරක්ෂිත කළාපය තුළ යම් ගොඩනැගිල්ලක් ඉදිකිරීම ආරම්භ නොකළ යුතු අතර දැනට ඇති ගොඩනැගිල්ලකට යම් එකතු කිරීමක් හෝ වැඩිදියුණු කිරීමක් නොකළ යුතු ය.

15. නිසි බලධරයාගේ පූර්ව ලිඛිත අවසරය නොලබා කිසිම පුද්ගලයකු රජයේ දෙපාර්තමේන්තුවක් හෝ පෞද්ගලික ආයතනයක් හෝ යම් තැනැත්තකු විසින් කටුනායක ගුවන් තොටුපළ අධි ආරක්ෂිත කළාපය තුළ යම් ඉදිකිරීම් කටයුතු හෝ කැණීම් කටයුතු නොකළ යුතු ය.

16. (1) තත් කාර්ය සඳහා පොලිස්පතිවරයා විසින් යථා පරිදි බලය පවරන ලද පොලිස් නිලධරයකු විසින් කටුනායක ගුවන් තොටුපළ අධි ආරක්ෂිත කළාපයයේ යම් පරිශ්‍රයකට ඇතුළු වී, මෙම නියෝගවල 14 වන හෝ 15 වන නියෝගවල විධිවිධාන උල්ලංඝනය කරමින් යම් ඉදිකිරීමක් හෝ කැණීම් කටයුත්තක් සිදු කරන්නේ ද යන්න පරීක්ෂා කරනු ලැබිය හැකි ය.

(2) මේ නියෝගවල 14 වන හා 15 වන නියෝගවල විධිවිධාන උල්ලංඝනය කරමින් යම් ඉදිකිරීමක් හෝ කැණීම් කටයුත්තක් සිදු කරන බවට සොයාගනු ලැබුවහොත්, එසේ සොයා ගන්නා පරීක්ෂාව සිදු කරන පොලිස් නිලධරයා විසින් එම ඉදිකිරීම් කටයුතු හෝ කැණීම් කටයුතු සිදුකිරීම වහාම නවත්වන ලෙස එම ඉදිකිරීම් හෝ කැණීම් කටයුතු භාර තැනැත්තා වෙත නියම කරනු ලැබිය හැකි ය.

(3) යම් තැනැත්තකුට එරෙහිව මෙම නියෝගය යටතේ යම් නියමයක් කරනු ලැබ ඇති අවසථාවක එම ඉදිකිරීම් කටයුතු හෝ කැණීම් කටයුතු දිගටම සිදු කිරීම අවශ්‍ය වන්නේ ඇයි ද යන්න පිළිබඳව හේතු දක්වමින් අමාත්‍යවරයා වෙත ඒ තැනැත්තා විසින් අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය. ඉදිරිපත් කරනු ලැබ ඇති අවස්ථානුගත කරුණු අනුව අමාත්‍යවරයා විසින් එකී ඉදිකිරීම් හෝ කැණීම් කටයුතු දිගටම කරගෙන යාමට අවසර දීම හෝ එකී කටයුතු තහනම් කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

(4) (3) වන ඡේදයේ ප්‍රකාරව යම් ඉදිකිරීම් කටයුතු හෝ කැණීම් කටයුතු දිගටම සිදුකිරීම තහනම් කිරීමෙන් පසු එම වැඩ දිගටම සිදු කරන යම් තැනැත්තෙක් මේ නියෝග යටතේ වරදකට වරදකරු වන්නේ ය.

17. කවර හෝ හේතුවක් නිසා කිසිම තැනැත්තකු විසින් කටුනායක ගුවන් තොටුපළ අධි ආරක්ෂිත කළාපය තුළ රතිඤ්ඤා හෝ කවර හෝ විස්තරයකට අයත් ගිනිකෙළි නොදැල්විය යුතු ය. මේ නියෝගවල විධිවිධාන උල්ලංඝනය කරන කවර හෝ තැනැත්තකු වරදකට වරදකරු වන්නේ ය.

18. මේ නියෝගවල විධිවිධාන උල්ලංඝනය කරන හෝ මේ නියෝගවල විධිවිධාන යටතේ අවස්ථාවෝචිත පරිදි නිසි බලධරයා හෝ යම් පොලිස් නිලධරයකු විසින් කරන ලද හෝ දෙන ලද යම් නියමයකට හෝ විධානයකට අනුකූලව ක්‍රියා කිරීම ප්‍රතික්ෂේප කරන හෝ පැහැර හරින නැතහොත් මේ නියෝග යටතේ තම කාර්ය කරන අතරතුර දී නිසි බලධරයා හෝ ඔහුගේ විධානය යටතේ ක්‍රියා කරන යම් තැනැත්තෙක් හෝ පොලිස් නිලධරයෙකු හෝ වළක්වන හෝ ඔහුට බාධා කරන නැතහොත් එසේ වැළැක්වීමට හෝ බාධා කිරීමට අන් තැනැත්තකුට කටයුතු සලස්වන යම් තැනැත්තෙක් මේ නියෝග යටතේ වරදකට වරදකරුවන අතර මහෙස්ත්‍රාත්වරයකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී අවුරුදු දෙකකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයකින් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකට හෝ රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

19. මේ නියෝගවල කාර්යය සඳහා .–

" ගොඩනැගිල්ල " යන්නට ස්ථිර හෝ තාවකාලික ව්‍යුහයක් ඇතුළත් වේ ;

" ලොරිය" සහ " ට්‍රේලරය" යන්නට (203 වන අධිකාරය වූ ) මෝටර් වාහන පනතේ 240 වන වගන්තිය යටතේ දී ඇති අර්ථය ම තිබිය යුතු ය.

*උපලේඛනය*

කටුනායක ගුවන් තොටුපළ අධි ආරක්ෂිත කළාපය, බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, පහත දැක්වෙන මායිම් තුළ පිහිටි බිම් ප්‍රදේශයෙන් සමන්විත වේ .–

*උතුරට* : ජී ආර් 98 1227 න් ආරම්භ වී මීගමුව මිනුවන්ගොඩ මාර්ගය ඔස්සේ ජී ආර් – 034229 දක්වා ;

*නැගෙනහිරට* : ජී ආර් 034229 න් ආරම්භ වී ඉදල්ගොඩැල්ල මාර්ගය ඔස්සේ ජී ආර් 036227 දක්වා ; ජී ආර් 036277 සිට, ආසිරි ගාඩින්ස්, ජපමාල හන්දිය ඔස්සේ අඳිනු ලබන මනඃකල්පිත රේඛාවක් ඔස්සේ ජී ආර් 038215 දක්වා ; ජී ආර් 038215 සිට අශෝකාරාම මාර්ගය ඔස්සේ ජී ආර් 035207 දක්වා ; ජී ආර් 035207 සිට ගංගාරාම මාර්ගය ඔස්සේ ජී ආර් 028184 දක්වා ; ජී ආර් 028184 සිට මුතු කුඩ මාර්ගය ඔස්සේ ජී ආර් 028179 දක්වා ;

*දකුණට* : ජී ආර් 028179 න් ආරම්භ වී දඬුගම මාර්ගය ඔස්සේ ජී ආර් 018173 දක්වා ; ජී ආර් 018173 සිට කුළුන අසල බෝඩර් මාර්ගය ඔස්සේ ජී ආර් 016173 දක්වා ; ජී ආර් 016173 සිට අමන්දොලුව මාර්ගයේ ජී ආර් 016174 දක්වා ජී ආර් 016174 සිට පන්සල පාර ඔස්සේ ජී ආර් 004170 දක්වා ; ජී ආර් 004170 සිට 18 වන සැතපුම් කණුව බෝඩර් මාර්ගය ඔස්සේ ජී ආර් 001170 දක්වා ;

*බස්නාහිරට* : ජී ආර් 001170න් ආරම්භ වී මීගමුව කලපුව උඩින් අඳින ලබන මනඃකල්පිත රේඛාවක් ඔස්සේ ජී ආර් 982216 දක්වා ; ජී ආර් 982216 සිට අලුත්වත්ත මාර්ගය ඔස්සේ ජී ආර් 983219 දක්වා ; ජී ආර් 983219 සිට නිකලස් මාකස් මාර්ගය ඔස්සේ ජී ආර් 984218 දක්වා ; ජී ආර් 984218 සිට කොළඹ මීගමුව මාර්ගය ඔස්සේ ජී ආර් 981227 දක්වා.

---

07–407/1

**2007 අංක 4 දරන හදිසි අවස්ථා (කටුනායක ගුවන් තොටුපළ සහ ඒ අවට අධි ආරක්ෂිත කළාප) නියෝග**

නිසි බලධරයා පත් කිරීම

2007 අංක 4 දරන හදිසි අවස්ථා (කටුනායක ගුවන් තොටුපළ සහ ඒ අවට අධි ආරක්ෂිත කළාප) නියෝගවල 3 වන නියෝගය මගින් මා වෙත පවරා ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මහින්ද රාජපක්ෂ වන මම, ඉහත සඳහන් නියෝගවල කාර්යය සඳහා නිසි බලධරයා වශයෙන් එයාර් කොමදෝරු කෝලිත අරවින්ද ගුණතිලක ආර්ඩබ්පී,ආර්එස්පී, යූඑස්පී, එන්ඩීසී, පීඑස්සී, විය යුතු බවට මෙයින් ප්‍රකාශයට පත් කරමි.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2007 ජූලි මස 04 වන දින,
කොළඹ දී ය.

| W/P | DR | W/P | GR |
|---|---|---|---|
| A | 001170 | J | 035207 |
| B | 982216 | K | 028184 |
| C | 983219 | L | 028179 |
| D | 984218 | M | 018173 |
| E | 981227 | N | 016173 |
| F | 034229 | O | 016174 |
| G | 036224 | P | 004170 |
| H | 038215 | | |

| STRETCH | ROAD |
|---|---|
| A-B | Lagoon |
| B-C | Aluth Watte Road |
| C-D | Nicolas Markus Road |
| D-E | Colombo/Negombo Road |
| E-F | 246 Minuwangoda Road |
| F-G | Iddegodalla Road |
| G-H | Asiri Garden-Japamala Junction |
| H-J | Asokarama Road |

| STRETCH | ROAD |
|---|---|
| J-K | Gangarama Road |
| K-L | Mutuwadiya Road |
| L-M | Dandu Gama Oya |
| M-N | Border Road Near Tower |
| N-O | Amandoluwa Road |
| O-P | Temple Road |
| P-A | Border Road Near 18th Mile Post |

07–407/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.